ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ව්‍යවසායකත්වය හා කුඩා ව්‍යාපාර කළමනාකරණය වැඩ සටහන

අවසාන පරීක්ෂණය 2005/2006

මෙහෙයුම් කළමනාකරණයට හැඳින්වීමක් - **MCC 1105**

කාලය - පැය දෙකයි (02)

---

දිනය : 2006.02.25 වේලාව : පෙ.ව.10.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.
සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

01. (අ) නිෂ්පාදන ක්‍රියාවලියක යෙදවීම්, ක්‍රියාවලිය සහ ප්‍රතිදාන පැහැදිලි කරන්න. සුදුසු උදාහරණ දෙමින්, පුද්ගලික අංශයේ පොදු ප්‍රවාහන සේවා ව්‍යාපාරයේ නිෂ්පාදන ක්‍රියාවලිය සාකච්ඡා කරන්න.

(ආ) භාණ්ඩ හා සේවා අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

(ඇ) නිෂ්පාදනයේ පාලන ක්‍රියාවලිය පැහැදිලි කරන්න. ප්‍රධාන නිෂ්පාදන පාලන ආකාරයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 25)

02. භාණ්ඩ හෝ සේවාවල පාරිභෝගිකයින් පුද්ගලයින් මෙන්ම සංවිධානද වියහැක.

(අ) පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා මිළදී ගන්නා විවිධ ආකාරයේ සමාගම් කෙටියෙන් විස්තර කරන්න.

(ආ) නිෂ්පාදකයෙකු විසින් භාණ්ඩයක් හෝ සේවාවක් අළුතෙන් ඉදිරිපත් කිරීමට පෙර ඒවායේ වෙළඳපොළ ඉල්ලුම ඇස්තමේන්තු කිරීමේ දී සලකා බැලිය යුතු සාධක විස්තර කරන්න.

(ඇ) අළුත් බේකරි ආශ්‍රිත නිෂ්පාදන පෙළක් නිෂ්පාදනය කිරීම ආරම්භ කිරීමට පෙර ඒවාට ඇති ඉල්ලුම තීරණය කිරීමේදී ඔබ විසින් සලකා බලන සාධක මොනවා ද?

(ලකුණු 25)

03. කර්මාන්තශාලාව තුල භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට පෙර එය නිෂ්පාදන නිර්මාණය සහ නිෂ්පාදන ඉංජිනේරුකරණය යන අධියර දෙකකට බඳුන් වේ.

(අ) සුදුසු උදාහරණ දෙමින් නිෂ්පාදන සංවර්ධන ක්‍රියාවලියේ අධියර දෙක පැහැදිලි කරන්න.

(ආ) ඔබ හොඳින් දන්නා කුඩා කර්මාන්තයක් ආශ්‍රයෙන් නිෂ්පාදන සංවර්ධන ක්‍රියාවලිය විස්තර කරන්න.

(ඇ) නිෂ්පාදන සංවර්ධනයේදී ව්‍යවසායකයන්ට අවශ්‍ය සහාය ලබාගත හැකි ආයතන සඳහන් කරන්න.

(ලකුණු 25)

04. කර්මාන්තකරුවෙකු සිය කර්මාන්ත ශාලාව ස්ථානගත කිරීමට සුදුසු ප්‍රදේශයක් පිළිබඳව සොයා බලයි. ඔහුට යෝජිත ව්‍යාපාරය සඳහා අදාළ විවිධ ගුණාත්මක සහ ප්‍රමාණාත්මක සාධක සලකා බැලීමට සිදුවේ.

(අ) නිෂ්පාදකයෙකුට සිය කර්මාන්ත ශාලාව පිහිටුවීමට සුදුසු ප්‍රදේශයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක මොනවා ද?

(ආ) සුදුසු <u>වැඩබිමක්</u> තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු සාධක මොනවා ද?

(ඇ) කුඩා පරිමාණයේ ආහාර වෙළඳසැලක් පිහිටුවීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනිමේදී ඔබ විසින් සලකා බලනු ලබන සාධක විස්තර කරන්න.

(ලකුණු 25)

05. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) 18 වන සියවසේ සිදුවූ කාර්මික විප්ලවය මගින් නිෂ්පාදන පද්ධතිවලට ඇති වූ බලපෑම සාකච්ඡා කරන්න.

(ආ) "ඇණවුම් නිෂ්පාදනය" සහ "තොග නිෂ්පාදනය" අතර වෙනස පහදන්න.

(ඇ) අඛණ්ඩ, සවිරාම සහ ඇණවුම් නිෂ්පාදන පද්ධති කෙටියෙන් පැහැදිලි කරන්න.

(ඈ) තොග පාලන ක්‍රියාවලියේ ප්‍රධාන අවස්ථා තුන පැහැදිලි කරන්න.

(ලකුණු 25)

- හිමිකම් ඇවිරිණි. -